www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වෝල් වීදිය ජෙනරල් මෝටර්ස් සමාගම බංකොලොත්බවට පත්කරයි.

## Wall Street throws General Motors into bankruptcy

ජෙරී වයිට් විසිනි

2009 මැයි 29

පසුගිය දින කීපය තුල වාර්තා වු ජෙනරල් මෝටර්ස් සමාගම බංකොලොත් බවට තල්ලු කිරීමේ සැලසුම් සහ මෝටර් රථ කර්මාන්තය "ප්‍රතිව්‍යුහගත" කිරීම මගින් ඔබමා පරිපාලනය පිටුපස පවතින නග්න පන්ති අවශ්‍යතාවයන් එලි දැක්විනි.

බ්‍රහස්පතින්දා ඇමරිකාවේ ඉතා විශාලතම මූල්‍ය ආයතන කීපයක් ඇතුලු බැඳුම්කර හිමියන් කන්ඩායමක් ජෙනරල් මෝටර්ස් සමාගම බංකොලොත් බවෙන් ගොඩ ආවහොත් ඉන් සියයට විසි පහක් දක්වා තැන්පතු පිරිනැමීමට භාන්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් කරන ලද යෝජනාව පිලිගෙන ඇත.

මෙම ප්‍රධාන පෙලේ බැඳුම්කර හිමියන් සමග ඇති කර ගෙන ඇති ගනුදෙනුව - ජෙනරල් මෝටර්ස් කම්කරුවන් වෙත පැටවෙන දැඩි වේතන සහ ප්‍රතිලාබ කප්පාදු කිරීම් සමග - ශතවර්ෂයක කාලයක් පැවති කාර්මික දැවැන්තයකු ක්‍රමවත්ව බංකොලොත් බවට පත්කිරීමේ ඔබාමා පරිපාලනයේ සැලැස්මේ එක් කොටසකි. මෙම සැලැස්මට සමාගමේ දැනට ඉතිරිව සිටින කම්කරුවන්ගෙන් තුනෙන් එකක් රැකියාවලින් දොට්ට දැමීම සහ සිය ගනනක් ගනුදෙනු කටයුතුත් සමග සමාගමේ කර්මාන්ත ශාලාවලින් තුනෙන් එකක් අතුගා දැමීම ද ඇතුලත් වේ.

බැඳුම්කර හිමියන් ජෙනරල් මෝටර්ස් සමාගමේ ඩොලර් බිලියන 27 ක් වන අනාරක්ෂිත නයවලින් 20% ක් දරා සිටී. කෙසේ වුවද සමාගම කඩා වැටීමේ අද්දරට වැටී තිබෙන තත්වය තුල තම නය සඳහා විවෘත වෙලඳපොලේ ඩොලරයකට පැන්ස කීපයකට වඩා ලබා ගැනීමට ඔවුන්ට නොහැකිව ඇත. එසේ වුවත් ඔවුන් එක්සත් ජනපද භාන්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් එක පිට එක අනුග්‍රහයන් සහ මහජන මුදලින් අති මහත් ගෙවීමක් ද ඔවුහු ඉල්ලා සිටිති. මෙම සතිය ආරම්භයේදී ඔවුහු තමන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් සමාගම බංකොලොත් බවට පත්විය හැකි බව හා සමාගම ඇවර කිරීමකට තුඩුදිය හැකි බව හොඳින් දනිමින් ම ඔබාමා පරිපාලනයේ 10% ක කොටස් මිලදී ගැනීමේ යෝජනාව ප්‍රතික්ෂේප කලහ.

මෙම බැඳුම්කර හිමියන් ෆිඩැලිටි ඉන්වෙස්ට්මන්ට්ස්, රිසර්ව් ඇන්ඩ් මැනේජ්මන්ට් සමාගම සහ ෆ්‍රැන්ක්ලින් රිසෝසස් ඉන්කොපරේෂන් යන සමාගම් ඇතුලු "ආපදාවට පත් නය වෙලඳපොල" පිලිබඳ විශේෂ නිපුනත්වයක් ලබා ඇති ආයෝජන සමාගම්වලින් හා හෙජ් අරමුදල් කීපයකින් සමන්විත වේ. ඇන්ඩෘ සොනික් නැමැති නිව්යෝක් ටයිම්ස්හි ව්‍යාපාර තීරු ලියන්නාට අනුව "මෙම ආයෝජන ඉතා ඉක්මනින් දැනට වඩා විශාල වටිනාකමක් ලබාවී යන්න ආපේක්ෂා කරමින් සුදු කෙලින සමහර හෙජ් අරමුදල් එකී බැඳුම්කර වලට අතගසා ඇතිබව හැඟීයන පරිදි ජෙනරල් මෝටර්ස් බැඳුම්කර වල හිමිකම ඉතා ඉක්මනින් අතින් අතට මාරුවෙමින් පවති."

ආයෝජකයින්ට ප්‍රකාශයක් නිකුත් කරමින් මූල්‍ය ආයතන දන්වා සිටින්නේ "සංශෝධිත යෝජනාව" "බැඳුම්කර හිමියන්ට හොඳම විකල්පය බවත්" සමාගමේ ශේෂ පත්‍රය දැවැන්ත ලෙස ශක්තිමත් කරමින් හා එහි වත්කම්වල ශුද්ධ වටිනාකම සැලකිය යුතු ප්‍රමානයකින් වැඩිකරමින් අතිරේක අරමුදල් සමාගමට දීමට එක්සත් ජනපද භාන්ඩාගාරය සැලසුම් කරමින් සිටින බව ආයෝජකයින්ට ප්‍රකාශයක් නිකුත් කරමින් මූල්‍ය ආයතන කියා සිටියේ ය.

බැඳුම්කර හිමියන් කිහිප දෙනෙකු බංකොලොත් බව ප්‍රකාශ කල විනිසුරුවරයාගෙන් තමන්ට තවතවත් වාසිදායක ගනුදෙනු කොන්දේසි පිරිනමන ලෙස ඉල්ලා සිටින අතර තවත් සමහරු වෝල් වීදියේ රක්ෂන කරුවන් සමග ඇතිකරගෙන ඇති නය ගෙවීම් පැහැර හැරීම් හුවමාරුව මගින් තම ආයෝජන ආරක්ෂා කරගෙන ඇති බැවින් සමාගමේ කඩා වැටීමෙන් ලාභ උපදවා ගනිමින් සිටින බවට වාර්තා වී ඇත.

ආරම්භයේ සිටම මෝටර් රථ නිශ්පාදනයේ අර්බුදයට ඔබාමා පරිපාලනයේ මැදිහත් වීම කම්කරු පන්තිය මත ප්‍රහාරයක් බවටත් තවත් මහජන වත්කම් කොල්ලකෑමක් බවටත් පත් වී ඇත. ඉතා පැහැදිලිව ම මෙය කම්කරු පන්තියේ වියදම මතින් මූල්‍ය ප්‍රභූවේ බලගතුම කොටස්වල අවශ්‍යතා ආරක්ෂා කිරීමේ මෝටර් රථ කර්මාන්තයේ ව්‍යාජ ජනසතු කිරීම ඉදිරියට

ගෙනයෑමක් - ජෙනරල් මෝටර්ස් සමාගමේ 72.5% ක් පාලනයට ගැනීම - මිස සමාජයේ බහුතරයේ හෝ කම්කරුවන්ගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමක් නොවේ. දශක ගනනාවක අරගල මගින් මෝටර් රථ කම්කරුවන් විසින් දිනා ගන්නා ලද ජයග්‍රහනයන් (ජීවත් වීමට සරලන වේතන, සෞඛ්‍ය පහසුව, විශ්‍රාම ප්‍රතිලාබ, දරුවන්ගේ පාසල් අධ්‍යාපනය - ඉතා දීර්ග කාලයක් තිස්සේම ඇමරිකානු මූල්‍ය ප්‍රභුව විසින් තම ලාභ ලැබීමට පැවති බාධාවක් ලෙස සලකන ලදී.

ඔබාමා පරිපාලනය මෝටර් රථ කම්කරුවන්ට එල්ල කර ඇති මෙම ප්‍රහාරය කම්කරු පන්තියේ සෑම කොටසකම රැකියා හා ජීවන තත්වයන් මත ඉතා දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා වේදිකාව සකස්කර ගැනීමට පාවිච්චි කිරීමටත් ඒ මගින් වැඩකරන ජනතාවට දුගී බව හා පටි තද කර ගැනීම සහ ධනපතීන්ට ඉතා විශාල වශයෙන් වැඩිකරන ලද ලාභ ලබාදීම් මගින් එක්සත් ජනපද ආර්ථිකය "පුනර්ජීවනය" කිරීමට උත්සාහ දරමින් සිටී.

මෙම ක්‍රියාදාමයේ පිලිකුල් සහගත ස්වභාවය ජෙනරල් මෝටර් සමාගමට නය සපයන හස්තය වන ක්‍රයිස්ලර් සහ ජී.එම්.ඒ.සී. හි තම ආයෝජන මගින් ලාභ උපයාගත්, ඔබාමාගේ මෝටර් රථ විශේෂ කාර්ය බලකායේ ප්‍රධානියාවන ස්ටීවන් රැටනර්ගේ ක්‍රියාකලාපය දෙස බැලීමෙන් ම පැහැදිලි වේ. තම ශුද්ධ වටානාකම ඩොලර් මිලියන 608 ක් බවට තක්සේරු කරනු ලැබ ඇති පෞද්ගලික වත්කම් කලමනාකරුවකු වන රැටිනර් ෆෙඩරල් මූල්‍ය හෙලිදරව්වකට අනුව ක්‍රයිස්ලර් සහ ජී.එම්.ඒ.සී මිලයට ගත් සර්බරස් ප්‍රාග්ධන කලමනාකාර සමාගමේ ඩොලර් දස ලක්ෂ ගනනක කොටස් හිමිකර ගෙන ඇත. රැටිනර්ගේ "අවශ්‍යතා අතර ගැටුමක්" නියෝජනය කරන ඕනෑම ආයෝජනයක් විකුනා ඇති බව භාන්ඩාගාර දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි.

මැන්හැටන්හි 5 වන මාවතේ ...... නිවාසයක්, ගුවන් යානයක් සහ අශ්ව ගොවිපලක් ද හිමි රැටනර් විශේෂ කාර්ය බලකායේ ප්‍රධානියා ලෙස සියදහස් ගනන් විශ්‍රාමික කම්කරුවන්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ දන්ත සෞඛ්‍ය ආධාර සහ දෘෂ්‍යාධාර වහාම නතර කිරීම ඇතලු මෝටර් රථ කම්කරුවන්ගේ ජීවන තත්වයන් දැවැන්තව හා නිත්‍ය වශයෙන් කපා හැරීම්වලට එකඟවන ලෙස ඉල්ලා සිටියේ ය.

වෝල්වීදියේ ආයෝජකයින් තම අවශ්‍යතා ආරක්ෂාකර ගැනීම සඳහා ක්‍රියාකරන අනුකම්පා විරහිත ආකාරය හා යුනයිටඞ් ඕටෝ වර්කර්ස් සමිතිය ජෙනරල් මෝටර්ස් කම්කරුවන්ගේ රැකියා, ජීවන තත්වයන් හා වැඩ කොන්දේසි විනාශ කිරීම ස්ව කැමැත්තෙන්ම පිලිගැනීමට ක්‍රියාකරන ආකාරයත් එකිනෙකට මුලුමනින්ම ප්‍රතිවිරුද්ධ ය.

තම අනුග්‍රහ ගිවිසුමේ සාරාංශයක් ලෙස යුනයිටඞ් ඕටෝ වර්කර්ස් සමිතිය ප්‍රකාශ කලේ " මුහුන දී ඇති භායානක තත්වය තුල රජයේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට අපොහොසත් වීම යනු ජෙනරල් මෝටර්ස් සමාගමේ අවසානයයි. ඔබගේ කොටස්කරුවන් වන අපි භාන්ඩාගාර මෝටර් කාර්ය සාධක බලකාය සෑහීමට පත් කිරීම සඳහා ඉතා වෙහෙස වී සාමුහික කේවෙල් කිරීමේ ගිවිසුමට යම් යම් සංශෝධන එකතු කලෙමු." එය වැඩිදුරටත් කියා සිටියේ " අප විසින් වටහාගත යුතු වන්නේ යෝජිත ස්ව ශක්‍යතා සැලැස්ම සඳහා යු.ඒ.ඩබ්ලිව් සාමාජිකයන්ගෙන් පෙර නොවූ විරූ සහ වේදනා සහගත කැප කිරීම් අවශ්‍ය වේ" යනුවෙනි. මෙම ගිවිසුමෙන් වේතන, ප්‍රසාද දීමනා, අතිකාල, නිවාඩු, වැඩ කොන්දේසි, විශ්‍රාමික වෛද්‍ය පහසුකම් යනාදිය කප්පාදු කිරීම සමග දැනට ඉතිරි වී ඇති යු.ඒ.ඩබ්ලිව් රැකියා 62,000 න් 23,000 ක් විනාශ කිරීම සඳහා අවසර ලැබේ.

මේ මගින් සමාගමට ඩොලර් බිලියන 1.5 ක මුදලක් ඉතිරිකර දෙන අතර ශ්‍රම වැය එක්සත් ජනපදය තුල ටොයෝටා සහ වෙනත් ජාත්‍යන්තර සමාගම් මගින් පවත්වා ගෙන යන කර්මාන්ත ශාලාවල වෘතීය සමිති ලෙස සංවිධානය නොවූ කම්කරුවන්ගේ ශ්‍රම වැයට සමාන තත්වයට හෝ ඊටත් වඩා අඩු තත්වයටකට ගෙන එනු ඇත.

බැඳුම්කර හිමියන් තමන්ගේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා ඉතා දැඩි උත්සහයකින් සටන් කරමින් සිටින අතර යු.ඒ.ඩබ්ලිව් සමිතිය කම්කරුවන් පරම්පරා ගනනක් තිස්සේ ඉතා කටුක අරගලයකින් සහ කැපකිරීම් තුලින් දිනාගත් ජයග්‍රහනයන් පාවා දෙමින් සිටී. මෙය මෙසේ වී ඇත්තේ ඇයි ද යන්න තේරුම් ගැනීම සඳහා යු.ඒ.ඩබ්ලිව් නිලධරයේ සහජ නියාලුකමට හා දූෂිතබවට වඩා වැඩි යමක් වෙත අවධානය යොමුකල යුතුව ඇත.

පසුගිය දශක කීපයක් තිස්සේ යු.ඒ.ඩබ්ලිව් නිලධරය තමන් නියෝජනය කරන බවට කියා සිටින කම්කරුවන්ගේ භෞතික අවශ්‍යතාවලින් වෙන්වූ සහ එම අවශ්‍යතාවලට පටහැනිවූ අවශ්‍යතාවයන් වර්ධනය කොට ඇත. එහි සමාජිකත්වය තුනෙන් දෙකකින් අඩු වී ඇතත් එහි ක්‍රියාකාරී කන්ඩායමේ ආදායම (දැනට ඩොලර් බිලියන 1.2 ක් වන) සහ වත්කම් වර්ධනය වී ඇත. මෝටර් කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේදී යු.ඒ.ඩබ්ලිව් සමිතිය තමන් ගාස්තු ලබාගන්නා තම සාමාජිකයන් මත සුරාකෑමේ අනුකම්පා විරහිත කොන්දේසි පැටවීම සඳහා ශ්‍රම පොලීසියක් ලෙසත් වෝල් වීදියේ මුල්‍ය ආයතනවල ආධාරකරුවකු ලෙසත් ක්‍රියා කරමින් සිටී.

ඉහත ක්‍රියා කලාපයට ප්‍රතිලාබ වශයෙන් ඔබාමා පරිපාලනය යු.ඒ.ඩබ්ලිව් සමිතියට ජෙනරල් මෝටර්ස් සමාගමේ කොටස් බිලියන ගනනක් ද සංස්ථාපිත

අධ්‍යක්ෂ මන්ඩලයේ අධ්‍යක්ෂ තනතුරක් ද සමග ජෙනරල් මෝටර්ස් සමාගමේ තැන්පතු හිමිකමින් 20% ක් දක්වාද ප්‍රදානය කර ඇත. ඔවුන් මෙවැනි තත්වයකට පත්වීම හේතුවෙන් ඔවුන්ට හිමිව ඇති කොටස්වල වටිනාකම ඉහල දමා ගැනීම සඳහා යූ.ඒ.ඩබ්ලිව් සමිතියට ශ්‍රමවැය තවදුරටත් කපාහැරීමේ සෘජු මුල්‍යමය වගකීමක් ඇත.

යූ.ඒ.ඩබ්ලිව් ගිවිසුම් සාරාංශයේ ප්‍රකාශවන පරිදි "ව්‍යාපාර කටයුතුවල සැලකිය යුතු ප්‍රති ව්‍යුහගත කිරීමක් මෙන්ම විශාල ලෙස වර්ධනය වූ ශේෂ පත්‍රයක් සමග අනාගතයේ දී නව සමාගමේ ප්‍රාග්ධන අරමුදල් සැලකිය යුතු ප්‍රමානයක වටිනාකමක් නියෝජනය කරාවිය යන්න ගැන යථාර්තවාදී පෙරදැක්මක් ඇත."

යූ.ඒ.ඩබ්ලිව් සාමාජික කම්කරුවන්ගේ සමාජමය අවශ්‍යතාවට ගැඹුරින්ම සතුරු වූ සමාජමය අවශ්‍යතා නියෝජනය කරන සංස්ථාපිත සංගතයක් ලෙසත් "වෘතීය සමිතියක් යන වචනයේ අර්ථයෙන් එය කොහෙත්ම වෘතිය සමිතියක් නොවන බවත්" හඳුනා ගැනීම මෝටර් රථ කම්කරුවන්ගේ බැරෑරුම් අරගලයක ආරම්භක ලක්ෂ්‍ය වේ. කම්කරු පන්තිය මෙම සංවිධානයට හිත පක්ෂපාත වීමේ අවශ්‍යතාවයක් නැත්තා මෙන්ම එම සංවිධානය කර්මාන්ත ශාලාවලින් පිටට ඇද දමා තමන්ගේම පන්ති අවශ්‍යතා මත පදනම් වූ අරගලය සඳහා නව සංවිධාන ගොඩනගා ගත යුතුය.

මෝටර් රථ කම්කරුවන් ඓතිහාසිකව අනන්‍ය කරනු ලබන්නා වූ පන්ති අරගලයේ ප්‍රබල සම්ප්‍රදායන් පුනර්ජීවනය කිරීම සඳහා ආර්ථික ජීවිතයේ සමාජවාදී ප්‍රතිසංවිධානය සඳහා අරගලය ද සමස්තයක් ලෙස 'ඩිමොක්‍රැටික් පක්ෂයෙන්' සහ ධනපති දේශපාලනයෙන් දේශපාලන වශයෙන් කැඩී වෙන්වීම සහ කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව මත පදනම් වූ නව දේශපාලන ඉදිරි දර්ශනයක අවශ්‍යතාවය මතුකරයි.

© www.wsws.org